# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1794/23 - 2013 ජනවාරි මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2013.01.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

15 වැනි වගන්තිය යටතේ නියෝගය

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියමයෙන් කොළඹ මහ නගර සභා සීමාව තුළ, කොල්ලුපිටිය කොට්ඨාසයේ පිහිටි මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති කොළඹ මහ නගර සභාව සතු පොල්වත්ත ලොන්ඩරිවත්ත නමින් හැඳින්වෙන්නා වූ ඉඩම් කොටස 2013.01.01 වැනි දින සිට නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරමි.

මහින්ද රාජපක්ෂ,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය.

2013 ජනවාරි මස 18 වැනි දින,
අංක 15/5, බාලදක්ෂ මාවත,
කොළඹ 03,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ අංක 37 දරන කොල්ලුපිටිය කොට්ඨාසයේ පිහිටි ලියාපදිංචි බලයලත් මිනින්දෝරු පී. එම්. සුනිල් මහතා විසින් මැන පිළියෙල කරන ලද අක්. 00 රූඩ්. 03 පර්. 15.65 (හෙක්. 0.3431) ක් වූ 2012.09.17 දිනැති අංක 2072 දරන සැලැස්මේ කැබලි අංක A ලෙස සවිස්තරව පෙන්නුම් කර ඇති පෙරහැර මාවතේ පිහිටි පොල්වත්ත ලොන්ඩරිවත්ත නමින් හැඳින්වෙන පහත සඳහන් මායිම්වලින් යුක්ත වූ ඉඩම් කොටස.

**කැබලි අංක A**

| | | |
|---|---|---|
| **ප්‍රමාණය** | **:** | **අක්. 00 රූඩ්. 03 පර්. 15.65 (හෙක්. 0.3431)** |
| *උතුරට* | : | විදුලි බල මණ්ඩලය හා පෙරහැර මාවත ; |
| *නැගෙනහිරට* | : | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු දේපළ ; |
| *දකුණට* | : | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු දේපළ ; |
| *බටහිරට* | : | ධර්මකීර්ති ආරාමය හා විදුලි බල මණ්ඩලය. |

02 - 306


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - G 017188—345 (2013/01)